# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2026 අංක 5 දරන
## පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2026 පෙබරවාරි මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2026 පෙබරවාරි මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 10.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2026 අංක 5 දරන
## පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප්
## (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2026 පෙබරවාරි මස 17 වන දින]

එල්.ඩී.- ඕ 31/2025

**ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත ඉවත් කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2026 අංක 5 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය

**2.** ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පනත ඉවත් කිරීම

**3.** සැක දුරු කිරීම සඳහා, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව, ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 1 දරන පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් පනතේ විධිවිධාන ප්‍රකාර, 1982 අංක 1 දරන පනතේ 9 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර හෝ 1990 අංක 47 දරන පනතේ 9 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම ඇති සහ ඉහත සඳහන් විධිවිධාන යටතේ විශ්‍රාම වැටුපක් ලබන යම් තැනැත්තකුට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සහ එම දිනයට පසුව එම විශ්‍රාම වැටුප ලැබීම නතර විය යුතු බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

සැක දුරු කිරීම

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

PL 15605 - 768 (2026/01)

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.